// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2253/19 - 2021 නොවැම්බර් මස 10 වැනි බදාදා - 2021.11.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2021 අංක 230 දරන ආඥාව**

*මගේ යොමු අංකය:* 4-3/4/2020/LRB/181.
*ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි යොමු අංකය:* KSWD &EIP/ACQ/DWC/07.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වන ජේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 11 වන ජේදයේ දැක්වෙන නියමිත ඉඩම් ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්.චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2021 නොවැම්බර් මස 08 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
මිහිකත මැදුර, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

*උපලේඛනය*

*I ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි*
*වෙරැස්ගඟ - සංවර්ධන ව්‍යාපෘතිය*

*II ඉඩමේ විස්තරය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 508 කිත්තම්පහුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වැල්ලම්පිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/KLN/2021/407 හා 2021.09.07 වැනි දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලි තුන (03) ට මායිම්:

01. **කැබලි අක්ෂර** A - මහකුඹුර සහ කිත්තම්පහුව; ප්‍රමාණය: හෙක්. 0.6966

*උතුරට* : ශ්‍රී විවේකාරාම මාවත සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); *නැගෙනහිරට* : මාර්ගය (ප්‍රාදේශීය සභා) කිත්තම්පහුව පාරේ වරිපනම් අංක 267/20 දරන ඉඩම; *දකුණට* : කැබලි අංක B; *බටහිරට* : ශ්‍රී විවේකාරාම මාවත.

02. **කැබලි අක්ෂර** B -; ප්‍රමාණය:- හෙක්. 0.0498

*උතුරට*: කැබලි අක්ෂර A, කිත්තම්පහුව පාරේ වරිපනම් අංක 267/20 දරන ඉඩම සහ ඇළ; *නැගෙනහිරට*: ඇළ, කිත්තම්පහුව පාරේ වරිපනම් අංක 44/17 දරන ඉඩම සහ කැබලි අක්ෂර C;


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

*දකුණට* : කිත්තම්පහුව පාරේ වරිපනම් අංක 44/17 දරන ඉඩම සහ කැබලි අක්ෂර C සහ ශ්‍රී විවේකාරාම මාවත; *බටහිරට* : ශ්‍රී විවේකාරාම මාවත සහ කැබලි අක්ෂර A.

03. **කැබලි අක්ෂර** C - මහකුඹුර සහ කිත්තම්පහුව; ප්‍රමාණයඃ හෙක්ටයාර් 0.6859.

*උතුරට*: කැබලි අක්ෂර B සහ කිත්තම්පහුව පාරේ වරිපනම් අංක 44/17 දරන ඉඩම; *නැගෙනහිරට*: කිත්තම්පහුව පාරේ වරිපනම් අංක 44/17 , 44/14/D, 44/18/B, 48/19, 48/20, 48/21,48/22,48/23 දරන ඉඩම්; *දකුණට*: කිත්තම්පහුව පාරේ සොයාගත නොහැකි සැනොවින් උත්සව ශාලාව පිහිටි ඉඩම, ශ්‍රී විවේකාරාම මාවතේ වරිපනම් අංක සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි ඉඩම්, ශ්‍රී විවේකාරාම මාවතේ වරිපනම් අංක 50/10 දරන ඉඩම, ඇළ, ශ්‍රී විවේකාරාම මාවතේ වරිපනම් අංක 54C/0051/1 දරන ඉඩම සහ ශ්‍රී විවේකාරාම මාවත; *බටහිරට*: ශ්‍රී විවේකාරාම මාවත.

11-555

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2021 අංක 229 දරන ආඥාව**

*මගේ යොමු අංකයඃ* 4-3/4/2020/LRB/180.
*ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී යොමු අංකයඃ* KSWD &EIP/ACQ/DWC/07.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වන ජේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 11 වන ජේදයේ දැක්වෙන නියමිත ඉඩම් ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2021 නොවැම්බර් මස 08 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය
මිහිකත මැදුර, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

*උපලේඛනය*

I *ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී*
*වෙරැස්ගග - සංවර්ධන ව්‍යාපෘතිය*

*II ඉඩමේ විස්තරය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 506 C, මහබුත්ගමුව B ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මහබුත්ගමුව B ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/KLN/2021/406 හා 2021.09.08 වැනි දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලි තුන (03) ට මායිම්:

01. **කැබලි අක්ෂර** A- තුප්පහිවෙල කුඹුර; ප්‍රමාණයඃ හෙක්. 2.9806

*උතුරට*: බ්‍රැන්ඩියාවත්ත පාරේ වරිපනම් අංකය සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි ඉඩම, මෙම ඉඩමේ ඉතිරි කොටස, පාර සහ ඩොනල්ඩ් පෙරේරා මාවත; *නැගෙනහිරට*: ඩොනල්ඩ් පෙරේරා මාවත සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; *දකුණට*: ඩොනල්ඩ් පෙරේරා මාවතේ වරිපනම් අංකය සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි ඉඩම, වීරමල් මාවතේ වරිපනම් අංකය සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි ඉඩම, වීරමල් මාවත, පාර, ඉඩමේ නම සොයාගත නොහැකි එන්. පී. ජයසිංහ, බී. එම්. ධම්මිකා පෙරේරා, නෝර්ටන් සහ තවත් අය හිමිකම් කියන ඉඩම, කැබලි අක්ෂර B, කැබලි අක්ෂර C බ්‍රැන්ඩියාවත්ත පාරේ වරිපනම් අංක සොයාගත නොහැකි එම්.කල්‍යාණවතී විජේගුණවර්ධන සහ තවත් අය හිමිකම් කියන ඉඩම; *බටහිරට*: බ්‍රැන්ඩියාවත්ත පාරේ වරිපනම් අංක සොයාගත නොහැකි එම්.කල්‍යාණවතී විජේගුණවර්ධන සහ තවත් අය හිමිකම් කියන ඉඩම සහ බ්‍රැන්ඩියාවත්ත පාරේ වරිපනම් අංකය සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි ඉඩම්.

02. **කැබලි අංක** B - ප්‍රමාණයඃ- හෙක්. 0.0353

*උතුරට* : කැබලි අක්ෂර C,A; *නැගෙනහිරට* : කැබලි අක්ෂර A, ඉඩමේ නම සොයාගත නොහැකි එන්. පී. ජයසිංහ, බී. එම් ධම්මිකා පෙරේරා, නෝර්ටන් සහ තවත් අය හිමිකම් කියන ඉඩම; *දකුණට* : ඇළ සහ බ්‍රැන්ඩියාවත්ත පාරේ වරිපනම් අංකය සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි ඉඩම් *බටහිරට* : කැබලි අක්ෂර C.

03. **කැබලි අක්ෂර** C - ප්‍රමාණයඃ- හෙක්. 0.1256

*උතුරට*: කැබලි අක්ෂර A; *නැගෙනහිරට*: කැබලි අක්ෂර A සහ B ; *දකුණට*: කැබලි අක්ෂර B, ඇළ බ්‍රැන්ඩියාවත්ත පාරේ වරිපනම් අංකය සොයාගත නොහැකි ඉඩම, පාර සහ බ්‍රැන්ඩියාවත්ත පාරේ වරිපනම් අංකය සොයාගත නොහැකි ඉඩම; *බටහිරට*: බ්‍රැන්ඩියාවත්ත පාරේ වරිපනම් අංකය සහ හිමිකම කියන්නා සොයාගත නොහැකි ඉඩම්, පාර සහ බ්‍රැන්ඩියාවත්ත පාරේ වරිපනම් අංක සොයාගත නොහැකි එම්. කල්‍යාණවතී විජේගුණවර්ධන සහ තවත් අය හිමිකම් කියන ඉඩම.

11-556

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.